**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) - 2015**

-----------------------------------------------------------

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 විගණන මතය

මූල්‍ය ප්‍රකාශනවලින්, 2015 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලංරාගිප්‍ර) අනුකූලවීම

ශ්‍රී ලංරාගිප්‍ර 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම - උපදේශක හා විනිශ්චය සේවාවන්ගෙන් ලැබෙන ආදායම උපචිත පදනමට ගිණුම්ගත කරනු වෙනුවට මුදල් පදනමට මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. එබැවින් මෙම සේවාවන්ගෙන් ලැබිය යුතු ආදායම තහවුරු කරගෙන සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ඉන්වෙන්ට්‍රි විෂයයන්ගේ ශේෂය භෞතිකව සත්‍යාපනය කර අගය කොට මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කරනු වෙනුවට රු.133,111,692 ක් වූ ඉන්වෙන්ට්‍රි විෂයයන් පිළිබඳ ලෙජර් ශේෂයන් එදිනට මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවලට එයින් වන බලපෑම නිශ්චය කරගත නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ වාර්ෂික තොග සත්‍යාපන වාර්තා අනුව, ඉන්වෙන්ට්‍රි විෂයයන් 1,057 ක් අනවශ්‍ය තොග ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේවුවද, ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ලද මුදලින් මුළු වටිනාකම රු.2,179,600 කට දේපල, පිරියත හා උපකරණ අත්කරගෙන තිබුණි. කෙසේවුවද, අධිකාරිය විසින් රු.2,000,000 ක මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාග්ධනිත කර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය අවසානයට ශුද්ධ වත්කම් රු.179,600 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) අධිකාරිය විසින් සේවය අවසන් කිරීම හේතුවෙන් සේවකයන් විසින් අධිකාරියට එරෙහිව ගොනුකර ඇති නඩු 04 කට අදාළව රු.863,698 ක මුදලක් ගෙවිය යුතු මුදල් ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේවුවද, මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

#### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණය අනුව පිළිවෙලින් වර්ෂ 03 කට වැඩි කාලයක් හා වර්ෂ 05 කට වැඩි කාලයක් පැවති රු.2,550,614 ක් හා රු.1,719,187 ක් වූ විවිධ

ණය හිමි ශේෂයන් නිරවුල් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පියවර ගෙන නොතිබුණි.

(ආ) 1997 සිට 2004 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ මෝටර් වාහන සහ පිරියත හා යන්ත්‍රෝපකරණ කුලියට දීමට අදාළව ජාතික උපකරණ හා යන්ත්‍රෝපකරණ ආයතනයෙන් (NEMO) ලැබිය යුතු රු.114,529,393 ක මුදලක් 2015 දෙසැම්බර් 31 වනවිටත් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෙම හිඟ ශේෂයන් සඳහා සම්පූර්ණ ප්‍රතිපාදනයක් කර තිබුණි.

### 2.2.4 හඳුනා නොගත් වෙනස්කම්

--------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයන් සහ අදාළ උපලේඛනයන්හි ශේෂයන් අතර රු.300,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

--------------------------------------------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම. |
|---|---|
| (අ). 1971 අංක 38 දරන මුදල් පනත | |
| (i) 11 වගන්තිය | මුදල් අමාත්‍යාංශයෙන් අවශ්‍ය අනුමැතිය ලබාගැනීමෙන් තොරව රු.15,707,803 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. |
| (ii) 14(1) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.6,677,674 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.20,384,756 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.13,707,082 ක වර්ධනයක් දැක්වුණි. කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහනෙන් ආදායම රු.6,646,250 කින් වැඩිවීම සහ ආදායම් උත්පාදන කාර්යයන් සඳහා වියදම් රු.6,310,868 කින් අඩුවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියේ 258 ක් වූ කාර්යමණ්ඩලය, රු.මිලියන 1,316 ක් වටිනා මුළු වත්කම් හා සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු රු.මිලියන 223 ක් වූ රජයේ දායකත්වය උපයෝජනයෙන් අධිකාරියේ මෙහෙයුම් ඌනතාවය රු.මිලියන 6.6 ක් විය.

(ආ) ඉකුත් වර්ෂයේ සියයට 1.6 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ ඌනතාවය මුළු වත්කම්වලින් සියයට 0.5 ක් නියෝජනය වූ අතර, එයින් සියයට 1.1 ක හිතකර තත්ත්වයක් දැක්වුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, අධිකාරියේ ක්‍රියාකරු පුහුණු මධ්‍යස්ථානයට (Operator Training Centre) සහ ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානයට (Construction Equipment Training Centre) සමාලෝචිත වර්ෂය තුළ එහි ඉලක්කගත අභ්‍යන්තර ඉපැයීම් සපුරා ගැනීමට නොහැකිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තරය | ඉලක්කගත ආදායම | ඉටුකර ගැනීම | ඉලක්කගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස ඉටුකර ගැනීම් |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | |
| ක්‍රියාකරු පුහුණු මධ්‍යස්ථානය | | | |
| - වෙනත් උපකරණවලින් සහ යන්ත්‍ර ක්‍රියාකරු පුහුණු වැඩසටහනෙන් ආදායම | 17.27 | 13.47 | 77.9 |
| - යන්ත්‍ර හා උපකරණ කුලියට දීමෙන් ආදායම | 18.00 | 1.62 | 9.0 |
| ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය | | | |
| - ඉදිකිරීම් උපකරණ පුහුණු ආදායම | 16.55 | 8.31 | 50.2 |
| - වැඩමුළු, අලුත්වැඩියා කාර්යයන් සහ උපදේශක සේවා ආදායම | 18.50 | 11.43 | 61.8 |

අධිකාරියේ ඉහළ මට්ටමේ කළමනාකරණයේ අවධානය මේ සම්බන්ධයෙන් යොමුකර නොතිබුණි.

(ආ) ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානයේ (CETRAC) වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයන් වූයේ, ඉදිකිරීම්වලට අදාළ පුහුණු වැඩසටහන් පැවැත්වීම හා ඉදිකිරීම් කර්මාන්තය සඳහා කළමනාකරණ සේවා සැපයීමයි. කෙසේවුවද, ශ්‍රවණාගාරය හා සම්මන්ත්‍රණ කාමරය කුලියට දීමෙන් ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය විසින් 2015 වර්ෂය තුළදී ආදායමෙන් ප්‍රධාන කොටස උපයා තිබුණි.

(ඇ) අධිකාරියේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම මාස 03 ක කාලයක් ඇතුළත පිළියෙල කිරීම සඳහා රු.150,000 ක එකවර ගෙවීමකට 2015 අප්‍රේල් 27 දින අධිකාරිය විසින් පැවරුම් පදනම මත උපදේශකයෙකු පත්කර තිබූ අතර ඔහුගේ කාර්යසාධනය පදනම්ව වාරික තුනකින් ගෙවීම කළ යුතු විය. තවද, උපදේශකවරයා විසින් නිමකරන ලද වැඩ විස්තර (යෝජනා කරන ලද ලියවිල්ලේ කෙටුම්පත් පිටපතක්) 2015 ජූලි 05 දින අධ්‍යක්ෂ (මානව සම්පත්) වෙත ඉදිරිපත් කර තිබූ අතර, රු.50,000 ක මුදලක් 2015 අගෝස්තු 10 දින ඔහුට ගෙවා තිබුණි. කෙසේවුවද, මානව සම්පත් සංවර්ධන සැලැස්මේ අවසාන පිටපත 2016 මැයි අවසානය වනවිටත් අධිකාරියට ඉදිරිපත් කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ දුර්වලතා

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල 1996 වර්ෂයේ සිට වර්ෂයක් පාසා ඉදිරියට ගෙන එන ලද රු.2,663,659 ක විදේශ ආධාර මුදල් ශේෂය මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ජාතික පාරිසරික ඉදිකිරීම් තාක්ෂණ තේමා පියෙස (National Environment Construction Technical Theme Park) මගින් ආදර්ශ ඉදිකිරීම් ක්‍රම හඳුන්වාදීම හා ප්‍රදර්ශනය කිරීම, නවීන හා සාම්ප්‍රදායික ගොඩනැගිලි ද්‍රව්‍ය හා ශිල්පීය ක්‍රම වර්තමානයේ යොදා ගැනීම සහ ඉදිකිරීම් පිළිබඳ දැනුම සමාජ ප්‍රජාව සඳහා දැක්වීම හා බෙදාහැරීම ක්‍රමයෙන් විකාශය කර තිබුණි. ඉහත ව්‍යාපෘතිය 2011 දෙසැම්බර් මාසයේදී ආරම්භ කර තිබූ අතර, 2014 දෙසැම්බර් මාසයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී ආදර්ශ නිවාස 05 ක් ඉදිකිරීමට ව්‍යාපෘතිය සැලසුම් කර තිබුණි. කෙසේවුවද, ආදර්ශ නිවාස 04 ක් පමණක් ගොඩනැගීම ආරම්භ කර තිබූ අතර, එයින් 02 ක් පමණක් නිශ්චිත ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී සම්පූර්ණ කර තිබුණි. ඉතිරි ආදර්ශ නිවාස 2016 මැයි 31 වනවිටත් ඉදිකර නොතිබුණි.

(ii) ව්‍යාපෘති යෝජනාවේ ඇතුළත් වැසි ජල අස්වනු පද්ධති සහිත නිවාස ඉදිකිරීම, බලශක්ති කාර්යක්ෂමතාවය ලෙස සූර්ය බල ශක්තිය ඵලදායීව යොදා ගැනීම ප්‍රදර්ශනය කිරීම, ආදර්ශ සුළං බලය උත්පාදන පිරියත ස්ථාපනය කිරීම, වියළි කලාප ප්‍රදේශ සඳහා බොරලු පාරවල් ඉදිකිරීම යනාදී කාර්යයන් 2016 මැයි අවසානය වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) තේමා පියෙස (Theme Park) ඉදි කරන ලද ඉඩමේ අයිතිය නිරවුල්ව හඳුනාගෙන නොතිබුණි.

## 4.3 විශ්‍රාම ප්‍රතිලාභ සඳහා අරමුදලක් ගොඩනැගීම

--------------------------------------------------

පාරිතෝෂික ගෙවීම සඳහා 2015 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල රු.61,791,489 ක ප්‍රතිපාදනයක් කර තිබුණද, අනාගත වගකීම් දැරීම සඳහා එම ප්‍රතිපාදන ආයෝජනය කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

**4.4 අභ්‍යන්තර විගණන ඒකකය**

අධිකාරිය විසින් සහකාර අභ්‍යන්තර විගණක හා කළමනාකරණ සහකාර යන නිලධාරීන් දෙදෙනෙකු පමණක් 2011 ජුනි සිට අභ්‍යන්තර විගණන අංශයට වැඩ බැලීමේ පදනම මත පත්කර තිබුණි.

**4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,677,674 ක ඌනතාවයක් විය. කෙසේවුවද, එහි කාර්යමණ්ඩලයට වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීමේ අරමුණ සඳහා රු.31,529,349 ක ශුද්ධ ලාභයක් එම කාල පරිච්ඡේදය සඳහාම පෙන්නුම් කරමින් වෙනම ආදායම් ප්‍රකාශනයක් අධිකාරිය විසින් පිළියෙල කර තිබුණි. ඒ අනුව, 2015 දෙසැම්බර් 09 දිනැති අංක 02/2015 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ වාර්ෂික ප්‍රසාද දීමනා ලෙස එහි සේවක මණ්ඩලයට රු.2,317,245 ක මුදලක් ගෙවා තිබුණි.

**4.6 මානව සම්පත් කළමනාකරණය.**

2015 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 360 ක් හා 258 ක් විය. වර්ෂ කිහිපයක සිට පුරප්පාඩු තනතුරු පිරවීමට ප්‍රමාණවත් පියවර ගැනීමෙන් තොරව, අභ්‍යන්තර විගණක, අධ්‍යක්ෂ (මුදල්), නියෝජ්‍ය අධ්‍යක්ෂ මෙහෙයුම් (පුහුණු මධ්‍යස්ථානය) ආදී විධායක මට්ටමේ තනතුරු 18 ක් ඇතුළත්ව පුරප්පාඩු 102 කින් පුරප්පාඩු 27 ක් 2015 දෙසැම්බර් 31 දිනට වැඩ බැලීමේ පදනම මත පත්කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

**5. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

**5.1 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

| | | | |
|---|---|---|---|
| (අ) | ගෙවිය යුතු හා ලැබිය යුතු ගිණුම් | - | ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂයන් අදාළ පාර්ශවයන් විසින් සනාථ කර නොතිබුණි. |
| (ආ) | ආදායම් කළමනාකරණය | - | අධිකාරිය විසින් අනුක්‍රමික පිළිවෙලකින් තොරව ඉන්වොයිසි නිකුත් කර තිබුණි. |